දරුවන් උදෙසා බයිබලයක්

# ජේසුස් වහන්සේ 5000 කගේ බඩගිනි නිවන සේක



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

බොහෝ ආගමික නායකයෝ (ඔවුන් ඵරිසිවරුන් ලෙස හැඳින්වේ) ජේසුස් වහන්සේ ගැන බොරු කීවෝය. ඇතැම් අය උන්වහන්සේව මරා දැමීමට පවා උත්සාහ කළෝය.



උන්වහන්සේ ඇත්තටම දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව
ඔවුහු විශ්වාස නොකළෝය. උන් වහන්සේ දෙවියන්
වහන්සේගේ පුත්‍රයා බව ඔප්පු කරන ප්‍රාතිහාර්යයන් කළත්
ඔවුහු උන් වහන්සේ
නොපිළිගත්තෝය.



දිනක් ජේසුස් වහන්සේ ගලීල මුහුදින් එතෙරට ගිය සේක. සමහරවිට එතුමන් වටා සෑම විටම රැස්ව සිටි සමූහයාගෙන් කුඩා විවේකයක් උන්වහන්සේට අවශ්‍ය වූවා විය හැකිය.

නමුත් සමූහයා ඉක්මනින්ම උන්වහන්සේව සොයා ගත්තෝය. ජේසුස් වහන්සේ මහත් ආශ්චර්යයන් කළ බව ඔවුහු දැන සිටියෝය. ඔවුන්ට උන් වහන්සේ සමඟ සිටීමට අවශ්‍ය විය.





ජේසුස් වහන්සේ තම ගෝලයන්ව පාළු
කඳුකර ස්ථානයකට ගෙන ගිය අතර
එහිදී උන්වහන්සේ උගන්වමින් සිටි සේක.
සෙනඟ ක්‍රමයෙන් වැඩි විය. වැඩි වේලා
නොගොස් ආහාර ගන්නා
හවස් වේලාව උදාවිය.
සියලු දෙනාට බඩගිනි
දැණුනා විය හැක.

ජේසුස් වහන්සේ සෙනඟ දෙස බැලූ සේක. “මොවුන්ට කෑමට අපි රොටි මිලදී ගන්නේ කොතැනින්ද?” උන්වහන්සේ පිලිප්ගෙන් ඇසූ සේක. අවට ආහාර ලබාගත හැකි ස්ථාන තිබුණේ නැත. ජේසුස් වහන්සේ  සැලසුම් කළේ කුමක් විය හැකිද?



“මෙම පිරිසට ආහාර දීමටනම් විශාල මුදලක් වැය වනු ඇත” පිලිප් ජේසුස් වහන්සේට පිළිතුරු දුන්නේය. ජේසුස් වහන්සේට සහ උන්වහන්සේගේ ගෝලයන්ට එතරම් මුදල් තිබුණේ නැත.





තවත් ගෝලයෙකු වූ අන්දෘ
(සීමොන් පේතෘස්ගේ
සහෝදරයා) ජේසුස්
වහන්සේට මෙසේ කීවේය:
“මෙහි රොටි පහක් සහ
කුඩා මසුන් දෙදෙනෙකු
ඇති පිරිමි ළමයෙකු සිටියි”.

නමුත් විශාල පිරිසක් සිටිද්දී ඒවා කුමක් කරන්නද? කුඩා පිරිමි දරුවා ඒවා ජේසුස් වහන්සේට දීමට කැමති වුවද, ඔහුගේ ඒ කුඩා ආහාර වේල එතරම් විශාල ජනතාවකගේ බඩගින්න නිවන්නේ කෙසේදැයි අන්දෘ දැන නොසිටියේය.



ජේසුස් වහන්සේ “ජනතාව අසුන් ගන්න සළස්වන්න යැ” යි කීසේක. එහෙයින් මිනිස්සු පන්දහසක් පමණ බිම වාඩි වූවෝය. පන් දහසක්! එසේය! කාන්තාවන් සහ ළමයින් ගණන ඇතුළත් නොවී මිනිසුන් ගණන පමණක් පන්දහසක් විය.



ඉන්පසු, ජේසුස් වහන්සේ රොටි සහ මාළු අතට ගත්සේක.
කුඩා දරුවා ජේසුස් වහන්සේව විශ්වාස කළා විය හැක.
ජේසුස් වහන්සේට ඔහුගේ දිවා
ආහාරය අවශ්‍ය වූයේ කුමක් නිසාද
කියා හෝ ජේසුස් වහන්සේ එයට
කුමක් කරාවිද කියා හෝ ඔහු දැන
සිටියේ නැත. “මගේ දවල් කෑම
වේල දුන්නොත් මට කෑම
නොලැබෙන්නේයැ”
යි කියාද ඔහු
සිතන්නට ඇත.
නමුත් ඔහු එය
ජේසුස්
වහන්සේට
දුන්නේය.



ඉන්පසු ජේසුස් වහන්සේ
යාච්ඤා කළ සේක.
උන්වහන්සේ දෙවියන්
වහන්සේට ස්තුති කළ
සේක. රොටි පහක් සහ
මසුන් දෙදෙනෙක්
වෙනුවෙන්? එසේය!
ජේසුස් වහන්සේ දෙවියන්
වහන්සේට ස්තූති දී ඒ
ආහාරයට ආශීර්වාද
කරන ලෙස ඉල්ලූ සේක.



ජේසුස් වහන්සේ යාච්ඤා
කළ පසු රොටි සහ මාළු
කඩා ජනතාව අතරේ
බෙදාදීම සඳහා ගෝලයින්ට
දුන් සේක. ඒ මොහොතේ
ජේසුස් වහන්සේ කළ
ආශ්චර්යය ඔවුහු දුටුවෝය.
සෑම කෙනෙක්ම තමාට
අවශ්ය ප්රමාණයෙන්
අනුභව කළො◌්ය. එහෙත්
රොටි සහ මාළු සියල්ලම
පාවිච්චි නොවීය.



සෑම කෙනෙකුටම ආහාර ලබා දුන් පසුත්, රොටි සහ මසුන් විශාල ප්‍රමාණයක් ඉතිරි විය. “කිසිවක් නැති නොවන පිණිස ඉතිරි කැබලි එකතු කරන්න” කියා ජේසුස් වහන්සේ ගෝලයන්ට කීසේක. ඔවුහු කෑම කා ඉතිරි වූ යව රොටි පහේ කැබලිවලින් කූඩ දොළහක් පුරවා ගත්තෝය.



එදා ජේසුස් වහන්සේ 5000 කට වැඩි පිරිසකගේ කුසගින්න කුඩා දරුවෙකුගේ දිවා ආහාරයෙන් නිවා දැමූ සේක. තවත් අවස්ථාවක, උන්වහන්සේ රොටි හතක් සහ මාළු ස්වල්පයකින් මිනිසුන් 4000 කට වැඩි පිරිසක් පෝෂණය කළ සේක. සාමාන්‍ය මිනිසුන් මෙම ලකුණු දැක ඵරිසිවරුන් මෙන් කිපුණේ නැත. ඒ වෙනුවට ඔවුහ, “මේ සැබවින්ම ලෝකයට පැමිණීමට නියමිතව සිටි අනාගතවක්තෘයැ” යි කීවෝය. දෙවියන් වහන්සේගේ ශුද්ධ වචනයෙන් පොරොන්දු වූ ගැළවුම්කරු ජේසුස් වහන්සේ බව ඔවුහු දැන සිටියෝය.



ජේසුස් වහන්සේ 5000 කගේ බඩගිනි නිවන සේක

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. යොහාන් 6

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වූ සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)